# රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල නිල නිවසක පුරප්පාඩුව

## ගෘහ පාලක/රෙදි පවිත්‍ර කරන්නා (කාන්තා/පිරිමි)

අපගේ නිල නිවසක නේවාසික කාර්යය මණ්ඩලයේ ගෘහ පාලක/රෙදි පවිත්‍ර කිරීමේ තනතුර සඳහා පුහුණු, වගකීම් සහගත පුද්ගලයෙක් සොයනු ලබයි. තෝරාගන්නා අපේක්ෂකයා සාමාන්‍ය ගෘහ පාලන සහ රෙදි පවිත්‍ර කිරීමේ කටයුතු සිදුකළ යුතු අතර පවිත්‍රතාව ඉතා උසස් මට්ටමකින් පවත්වා ගැනීමටත්, මනා වෘත්තියභාවයකින් කටයුතු කිරීමටත් වගබලාගත යුතුය.

**මූලික වගකීම්:**

- උද්‍යාන පාලකයන් විසින් පිරිසිදු නොකරන එළිමහන් බිම් පෙදෙස් සහ ගෘහස්ථ පෙදෙස් පිරිසිදු කිරීම ඇතුළු සියළුම සාමාන්‍ය ගෘහ පාලන කටයුතු සිදුකළ යුතුය.
- සේව්‍යයාට අයත් රෙදි සේදීම, මැදීම සහ සුරක්ෂිතව තබාගැනීම වැනි සියලුම කාර්යයන් පාලනය කළ යුතුය.
- නිවසේ අවශ්‍යතාවයන් ඉටුකළ යුතු අතර අවශ්‍ය කාර්යයන් සඳහා සහය ලබාදිය යුතුය.
- සේව්‍යයාගේ හෝ සේව්‍යයා විසින් පත්කරන ලද වරලත් නියෝජිතයාගේ අධීක්ෂණය යටතේ නිවසේ මෙහෙයුම් නිසි පරිදි සිදු කළ යුතුය.

**සේවා කාලසටහන:**

- සතියකට පැය 50 - පූර්ණ කාලීන

**මාසික වේතනය:**

- රු.112,984.87

**අවශ්‍ය සුදුසුකම්:**

- අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය අවසන් කර හෝ උත්සාහ කර තිබීම.
- ගෘහ පාලක හෝ රෙදි පවිත්‍ර කිරීමේ සේවාවන් හි අවම වශයෙන් වසර 2ක පළපුරුද්ද (සත්කාරක ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂයි).
- කුඩා දේවල් පිළිබඳව පවා මනා අවධානයක් යොමු කිරීම, බහුකාර්යය කුසලතාව සහ රැකියාව අවශ්‍ය පරිදි අනුගතවීමට ඇති නම්‍යශීලීබව.
- සෑම විටම වෘත්තීයමය වටිනාකම්, සාරධර්ම, සහ අවංකභාවය පවත්වාගෙන යාම.
- රෙදි පවිත්‍රකාරක, පිරිසිදු කිරීමේ සහ රෙදි පවිත්‍ර කිරීමේ උපකරණ භාවිතය පිළිබඳ පුළුල් දැනුම.
- සුරතල් සතුන් (බල්ලන්, පූසන් වැනි) සමඟ පහසුවෙන් කටයුතු කිරීමට හැකි වීම.
- ඉංග්‍රීසි භාෂාව මෙන්ම සිංහල සහ/හෝ දෙමළ භාෂාව චතුර ලෙස හැසිරවීමේ හැකියාව.

**(නිල නිවාස කාර්යය මණ්ඩලය ලෙස සේවය කරන ගෘහ සේවකයින් තානාපති කාර්යාලයේ සේවක මණ්ඩලය ලෙස නොසැලකෙන අතර ඔවුන් සේවය කරන නිවස අයිති පුද්ගලයාගේ සේවකයින් බව කරුණාවෙන් සලකන්න.)**

**අයදුම්කිරීම සඳහා උපදෙස්:**

මේ සඳහා උනන්දුවක් දක්වන පුද්ගලයන් පහත අනිවාර්යය විස්තර සහිත සම්පූර්ණ ජීව දත්ත පත්‍රයක් (CV) විද්‍යුත් තැපෑලෙන් යොමුකළ යුතුය.

1. සම්පූර්ණ නම
2. වර්තමාන ලිපිනය සහ දුරකතන අංකය
3. ඔබ වයස අවුරුදු 18 - 60 අතරද? (ඔව්/නෑ)
4. ඔබ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සම්පූර්ණ කර හෝ උත්සාහ කර තිබේද? එසේනම් විස්තර සපයන්න.
5. සමාන තනතුරක අවම වශයෙන් වසර දෙකක රැකියා පළපුරුද්ද තිබේද? එසේනම් එම ස්ථානයේ නම, සේවා කාලය, රාජකාරීන් සහ වගකීම් පිළිබඳව විස්තර සපයන්න.
6. ඔබේ වර්තමාන/පසුගිය මාසයේ සම්පූර්ණ වේතනය.

**අයදුම්කරන ආකාරය:**

ඔබේ අයදුම්පත මෑතකදී සකස් කරන ලද ජීව දත්ත පත්‍රයක් සමඟ **"ColomboERA@state.gov"** වෙත එවන්න. ඔබේ විද්‍යුත් තැපෑලේ විෂයය ලෙස **ගෘහ පාලක/රෙදි පවිත්‍ර කරන්නා** යනුවෙන් සඳහන් කළ යුතුය.

ඔබගේ අයදුම්පත් **2025 අගෝස්තු** 03 හෝ ඊට පෙර අප වෙත ළඟා විය යුතු ය.

**කෙටි ලැයිස්තුගත අපේක්ෂකයින් පමණක් සම්බන්ධ කර ගන්නා බව කරුණාවෙන් සලකන්න.**